# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1711/4 - 2011 ජුනි 20 වැනි සඳුදා - 2011.06.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/96

**1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

2011 ජුනි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 අංක 01 දරන නිල්වැල්ල ධීවර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නිල්වැල්ල ධීවර වරාය ප්‍රදේශය තුළ මසුන් ඇල්ලීමේ නියැලි සිටින යම් තැනැත්තෙකු විසින් මසුන් ඇල්ලීම සඳහා භාවිත කළ යුතු ධීවර ආම්පන්න පිත්ත සහ යොතට පමණක් සීමා විය යුතු ය.

3. මේ නියෝගවල යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේය.

4. මේ නියෝගවල -

"නිල්වැල්ල ධීවර වරාය ප්‍රදේශය" යන්නෙන් නිල්වැල්ල දුගහවැල්ල ප්‍රදේශයේ පිහිටි නිල්වැල්ල තුඩුව හෝ බෙරවගල සිට නිල්වැල්ල ප්‍රදේශයේ හංවැල්ල දක්වා වූ දේශීය ජල තීරයේ නාවික සැතපුම් එකයි දශම පහක (1.5) ක් ඇති ප්‍රදේශය අදහස් වේ.

07-143


1A - G 14691—2,330 (2011/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.